පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය
07

# අවසාන වාර පරීක්ෂණය - 2022

විෂයය :- නර්තනය

පාසලේ නම : ..............................................................................

ඇතුළත්වීමේ අංකය : ..............................

කාලය : පැය 02 යි

## I කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01. උත්සාහය නැමති ස්ථායි භාවයෙන් උපදින රසය වන්නේ,
   I භයානක රසයයි   II ශාන්ත රසයයි
   III වීර රසයයි   IV කරුණා රසයයි

02. තුරඟා වන්නමට අයත් බෙර පදය වනුයේ
   I කුඳ ගත ගත දොං   II දොම් කිත කිත දොම්
   III ජිං ගත ගොගො   IV දොං ජිංත ගත දොංත

03. සාම්ප්‍රදායික ගායනා විශේෂයකි.
   I මල් යහන් කවි   II තාලම් කවි
   III තලමල වරුණා කවි   IV කුළු කවි

04. තනි තිතේ ප්‍රභේද ගණන
   I 6 කි   II 3 කි   III 2 කි   IV 8 කි

05. “තෙයිත තෙයිත තෙයි තෙයියත් තාම්” මෙය
   I 4 වන පා සරඹ පදයයි   II 5 වන පා සරඹ පදයයි
   III 2 වන පා සරඹ පදයයි   IV 3 වන පා සරඹ පදයයි

පහත සඳහන් ප්‍රශ්න සඳහා ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.

06. උඩරට නර්තනයේ ගොඩ සරඹ, පහතරට නර්තනයේදී, ……………………..සරඹ නමින් හඳුන්වයි.

07. තාලය වාදනය කිරීම සඳහා ……………………..ප්‍රධාන තාල වාද්‍ය ලෙස භාවිතා කරයි.

08. කාවඩි නර්තනය ……………………..දෙවියන් උදෙසා නර්තනය කරයි.

09. රන් තෙලඹු වර්ණනාවේ කවි ……………………..නැටුම සඳහා යොදා ගනී.

10. ගවයා මූලික කොටගෙන පවත්වන්නේ ……………………..උත්සවයයි.

(තෛපොංගල්, කළ, කුළු, මුරුගන්, ගැටබෙරය, ඉලංගම්, තාලම්පට, රාමසාන්)

A කොටසේ ඇති වගන්තියට අදාල පිළිතුර B කොටසින් තෝරන්න.

| | A | B |
|---|---|---|
| 11. | කෝලම් රටා අඳින්නේ | ගැටබෙරය |
| 12. | හින්දු ආගමිකයන්ගේ උත්සවය | දෙවොල් බෙරය |
| 13. | පහතරට ප්‍රධාන වාද්‍ය භාණ්ඩය | තෛපොංගල් |
| 14. | කුඳ ගත ගත දොම් | දෑඩිය |
| 15. | දෙවන ගොඩ සරඹය | රාමසාන් |

පහත සඳහන් වගන්ති හරි නම් (√) ලකුණ ද වැරදි නම් (X) ලකුණද යොදන්න

16. කරගම් ද්‍රවිඩ ගැමි නැටුමකි. ( )

17. “චල් වළල්ල” විකල්ප වාද්‍ය උපකරණයකි. ( )

18. හනුමා වන්නම මාත්‍රා 3 තාලයට නර්තනය කරයි. ( )

19. ජේ.ඊ. සේදරමන් මහතා උඩරට නර්තන සම්ප්‍රදායේ ප්‍රවර්ධනයට දායක වූ ශිල්පියෙකි. ( )

20. පහතරට නැටුම් කෑගල්ල ප්‍රදේශයේ ප්‍රචලිතව ඇත. ( )

## II කොටස

ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.

01. I ප්‍රස්ථාරකරණයේදී භාවිත කරන තාල සංකේත 3 ක් ලියන්න. (ල. 03)
II ඔබ දන්නා බෙර පදයක් ප්‍රස්ථාර කරන්න. (ල. 04)
III මැදුම් තනි තිතට අයත් ඔබ දන්නා කවියක් ප්‍රස්ථාර කරන්න. (ල. 05)

02. I ප්‍රධාන නර්තන සම්ප්‍රදායන් තුනෙහි ශිල්පීය ප්‍රාගුණ්‍ය එළි දක්වන අවස්ථා 03 ක් වෙන වෙනම නම් කරන්න. (ල. 03)
II නර්තනය හා බැඳි සාර ධර්ම 3 ක් නම් කරන්න. (ල. 03)
III උඩරට නර්තන සම්ප්‍රදායේ ශිල්පීය ප්‍රාගුණ්‍ය එළි දක්වන අවස්ථාව පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ල. 06)

03. I දේශීය නර්තන සම්ප්‍රදායන් තුනට අයත් ප්‍රධාන ශාන්ති කර්ම 03 නම් කරන්න. (ල. 03)
II ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායට අයත් ශාන්ති කර්මයෙහි පැවැත්වෙන අරමුණු 02 ක් හා චාරිත්‍ර විධි 02 ක් නම් කරන්න. (ල. 04)
III ඔබ කැමති ශාන්ති කර්මයකට අයත් පුරාවෘත්තයක් ගැන කෙටි විස්තරයක් කරන්න. (ල. 05)

04. I ලංකාවේ පවත්වන ප්‍රධාන පෙරහැර 03 ක් නම් කරන්න. (ල. 03)
II එම පෙරහැරවල දක්නට ලැබෙන විශේෂාංග 04 ක් ලියන්න. (ල. 04)
III ඔබ ඉගෙන ගන්නා ලද පෙරහැර පිළිබඳ විස්තරයක් කරන්න. (ල. 05)

05. I සබරගමු නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන අවනද්ධ භාණ්ඩය නම් කර එය පංචතූර්ය වර්ගීකරණයේ කිනම් කොටසට අයත් වේදැයි සඳහන් කරන්න. (ල. 03)
II එය සන්නිවේදන කාර්යය සඳහා භාවිත කරන අවස්ථා 04 ක් ලියන්න. (ල. 04)
III එම අවනද්ධ භාණ්ඩයේ රූපසටහනක් ඇඳ කොටස් නම් කර කෙටි විස්තරයක් කරන්න. (ල. 05)

06. පහත සඳහන් මාතෘකා වලින් 03 ක් පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
I රාමසාන් උත්සවය
II ද්‍රවිඩ ගැමි නැටුම්
III විකල්ප උපකරණ
IV සරඹ
V එච්.එම්. ගෝමිස් මහතා (ල. 4 x 3=12)

07. I ගැමි නැටුම් 03 ක් නම් කරන්න. (ල. 03)
II ගැමි නැටුම්වල ලක්ෂණ 4 ක් ලියන්න. (ල. 04)
III තලමල වරුණ කව්වල සංස්කෘතික පසුබිම විස්තර කරන්න. (ල. 05)



LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න